# දැන්වීමයි

## සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි ලිඛිත/ පැවරුම් සහ ප්‍රායෝගික <u>පුනර් පරීක්ෂණ</u> සඳහා 2018/2019 අධ්‍යයන වර්ෂයට අදාළව අයදුම්පත් කැඳවීම

## සංගීත පීඨය

---

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සංගීත පීඨයේ 2018/2019 අධ්‍යයන වර්ෂයේ පළමුවන, දෙවන, තෙවන සහ අවසාන වසරවලට අදාළ ලිඛිත/ පැවරුම් සහ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා නැවත පෙනී සිටින (පරීක්‍ෂණ අසමත්, පරීක්‍ෂණ සඳහා පෙනී නොසිටි, වෛද්‍ය සහතික සහ අභියාචනා ඉදිරිපත් කරන ලද) සිසුන්ගෙන් 2021.09.02 දින සිට 2021.09.17 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

පවතින කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් පුනර් පරීක්ෂණ සඳහා ලියාපදිංචි කරගැනීම විශ්වවිද්‍යාල වෙබ්අඩවිය මාර්ගයෙන් සිදුකිරීමට තීරණය කර ඇත.

ඒ අනුව විශ්වවිද්‍යාල වෙබ්අඩවියෙහි ඇති අයදුම්පත්‍රය සම්පූර්ණ කර 2021.09.17 දිනට පෙර ලියාපදිංචි විය යුතු අතර එදිනට පසුව ලියාපදිංචි කරගනු නොලැබේ.

එක් විෂයක් සඳහා රු. 50/- ක මුදලක් ගෙවිය යුතුය. එය ලංකා බැංකුවේ නිදහස් චතුරශ්‍ර ශාඛාවේ අංක 84072227 දරණ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පොදු ගිණුමට බැර වන පරිදි ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා එම ලදුපත (කොළ පාට පිටපත) අයදුම්පතට අමුණා තිබිය යුතුය. <u>*නැතහොත් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියට පිවිස* **Pay Online** *හරහා* එක් විෂයක් සඳහා රු. 51.50/- ක මුදලක්</u> (බැංකු ගාස්තු ලෙස රු. 1.50/-)<u>ගෙවිය යුතුය.</u>

*සැ.යු.:- තමන් පෙනී සිටීමට අපේක්ෂිත පරීක්ෂණ සඳහා නිසි පරිදි මුදල් ගෙවා ලියාපදිංචිවීම සිසුන් සතු වගකීමකි.*

සහකාර ලේඛකාධිකාරී
විභාග අංශය
2021.09.01